**ටී සුරේෂ් කුමාර් එ පාරිභෝගික කටයුතු පිලිබඳ අධිකාරිය**

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/1344/2019 (2019.10.01 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්:** ඩී. ජී. එම්. වී. හපුආරච්චි

**අභියාචක** - ටී සුරේෂ් කුමාර්
**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිලධාරී, පාරිභෝගික කටයුතු පිලිබඳ අධිකාරිය

**පෙනීසිටීම**

අභියාචක - ටී. සුරේෂ් කුමාර්
පොදු අධිකාරිය - එම්. එස්. එම්. ෆවුසර්, අධ්‍යක්ෂ ජනරාල්/නම්කළ නිලධාරී
ආර්. ඩී. නිර්මලා, නියෝජ්‍ය අධ්‍යක්ෂ/නම්කළ නිලධාරී
රංගිකා කොන්දරාමගේ, ලේකම්
එම්. ඒ. එස්. එම්. අබේවර්ධන, නීති නිලධාරී

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.10.23 |
| තොරතුරු නිළධරයා තීරණය ලබා දුන් දිනය | 2018.11.13 |
| නම් කල නිළධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.11.28 |
| නම් කල නිළධරයා තීරණය ලබා දුන් දිනය | 2018.12.12(තොරතුරු ඉල්ලා සිටීම පිළිබඳ අභියාචනය ලද බව දැන්වීම)<br>2018.12.20 |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2019.02.21 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු:**

අභියාචක විසින් 2018.11.23 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිට දී ය

1. *පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පානීය ජල බෝතල් විකිණුම් මිල සම්බන්ධයෙන් සිදුකල විශේෂ අධ්‍යයන වාර්තාවේ සහතික කල පිටපතක් ලබාදෙන්න.*

2. *පානීය ජල බෝතල්වල උපරිම සිල්ලර මිල නියාමනය කරන නිර්ණායක කවරේද?*

3. *2018.09.28 දින නිකුත් කල අංක 2090/46 දරණ ඇති විශේෂ ගැසට් පත්‍රය නිකුත් කිරීම සඳහා පවත්වන ලද සියලු සාකච්ඡා වාර්තාවන්හි සහතික කල පිටපත් ලබාදෙන්න*

තොරතුරු නිලධාරියා 2018.11.13 දිනැතිව පිළිතුරු සපයමින් පවසා සිටියේ පනතේ 5 වන උපවගන්තියේ විධිවිධාන අනුව එම තොරතුරු හෙළිදරව් කිරීම භාණ්ඩ හා සේවාවල මිල ස්ථාවරව පවත්වා ගැනීම, පාලනය සහ ගැලපීම කෙරෙහි බලපෑ හැකි බැවින් අදාළ තොරතුරුවලට ප්‍රවේශවීම ප්‍රතික්ෂේප කරනු බවය. මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක 2018.11.28 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධරයා2018.12.12 දින තොරතුරු ඉල්ලා සිටීම පිළිබඳ අභියාචනය ලද බව දැනුම් දුන් අතර, 2018.12.20 දිනැතිව ප්‍රතිචාර දක්වමින් තොරතුරු නිලධාරියාගේ ප්‍රතික්ෂේප කිරීම නැවත ස්ථාපනය කරන ලදී. මෙම තීරණයෙන්ද අභියාචක සැහීමකට පත් නොවූ හෙයින් 2019.02.21 දිනැතිව අභියාචක කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

තමා විසින් ඉල්ලීම් කර ඇති කිසිදු තොරතුරක් මේ වන විටත් තමාට නොලැබී ඇති බව අභියාචක කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කරන ලදී.

පොදු අධිකාරිය විසින් තොරතුරු ලබාදීම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5 (1) (ඇ) (iv) උපවගන්තිය ප්‍රකාරව ප්‍රතික්ෂේප කල බව කොමිෂන් සභාව ප්‍රශ්නගත කිරීමේදී ඉදිරිපත් කරන ලදී. මෙහිදී කොමිෂන් සභාව විසින් ප්‍රකාශනය කරන ලද්දේ, තොරතුරු ඉල්ලීමෙහි, තොරතුරු ඉල්ලීම් අංක (2) වන '*පානීය ජල බෝතල්වල උපරිම සිල්ලර මිල නියාමනය කරන නිර්ණායක කවරේද?*' යන්න ඉහත ප්‍රකාශිත 5 (1) (ඇ) (iv) යටතේ ප්‍රතික්ෂේප කල නොහැකි බවත් මෙවැනි නිර්ණායක පොදු අධිකාරිය විසින් පොදු ජනතාවට නිසැකවම ලබා දිය යුතු නොහොත් ප්‍රදර්ශනය කල යුතු තොරතුරු වන බවත්ය.

අභියාචකට තොරතුරු වලට ප්‍රවේශ වීමට ඇති අයිතිවාසිකම ප්‍රතික්ෂේප කිරීම තවදුරටත් තහවුරු කිරීම සඳහා 5 (1) (ඇ) සහ 5 (1) (එ) යන උපවගන්තීන් පොදු අධිකාරිය විසින් අධියාචනය කරන ලදී. උපරිම සිල්ලර මිල (Maximum Retail Price - MRP) පිළිබඳ ගැටළුවක් පැන නැගීමේදී එය පරීක්ෂණය කිරීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවට යොමු කරන අතර පරීක්ෂණය සඳහා අදාළ පාර්ශවකරුවන්ගෙන් සියලුම තොරතුරු එක්රැස් කර ගනු බවත්, ඉන් පසුව අදාළ කර්මාන්ත වලින් ඔවුන්ගේ මිල ව්‍යුහයන්, පිරිවැය, පිරිවැය ව්‍යුහයන් ආදිය එකරැස් කොට, අදාළ පාර්ශ්වයන් සමඟ සාකච්චාවකට යොමු වන බව පොදු අධිකාරිය ප්‍රකාශ කරන ලදී. එමෙන්ම, පාරිභෝගික කටයුතු පිළිබඳ සභාවට ඕනෑම පාර්ශ්වයකින් තොරතුරු විමසීමට, තොරතුරු ලබාගැනීමට සහ සභාව ඉදිරියේ පෙනීසිටීමට බලතල ඇති අතර යමෙක් සභාවට එරෙහිව කටයුතු කරන්නේ නම් එය සභාවට අපහාස කිරීමක් වන බවත් පොදු අධිකාරිය විසින් පැහැදිලි කරන ලදී. පොදු අධිකාරිය විසින් මෙලෙස එක්රැස් කරගන්නාවූ කිසිදු තොරතුරක් රහස්‍යභාවය හේතු කොට ගෙන වෙනත් පුද්ගලයෙකුට ප්‍රවිෂ්ඨ වීමට ඉඩ සැලසීමට නොහැකි බවට 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 20(8) උපවගන්තිය ප්‍රකාරව තර්ක කරන ලදී. 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 20(8) යන උපවගන්තිය පහත පරිදි වේ:

> *"(2) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමකට අනුකූලව ඉදිරිපත් කරනු ලැබූ යම් ලේඛනයක් රහස්‍ය ලේඛනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ ලේඛනයේ අන්තර්ගත කිසිවක් යම්*

*නීතියක් යටතේ හෙළිදරව් කිරීමට නියම කරනු ලැබ ඇති අවස්ථාවක හැර, සභාව විසින් කිසිදු තැනැත්තෙකුට හෙළිදරව් නොකළ යුතු ය.''*

කොමිෂන් සභාව මෙහිදී ප්‍රකාශනය කරන ලද්දේ, තොරතුරු ඉල්ලීම් අංක (2) ඔස්සේ ඉල්ලීම් කර ඇති '*පානීය ජල බෝතල්වල උපරිම සිල්ලර මිල නියාමනය කරන නිර්ණායක කවරේද?*'යන්න නිර්ණායකයක් වන බැවින් ඉහත සඳහන් කිසිදු උපවගන්තියකට යටත් නොවන බවත් එය ඕනෑම පාරිභෝගිකයෙකුට පරිශීලනය කල හැකි පොදු වාර්තාවක් විය යුතු බවත්ය. ඉල්ලීම් අංක (1) හා (3) සම්බන්ධයෙන් පොදු අධිකාරියේ ස්ථාවරය වනුයේ එම තොරතුරු පරීක්ෂණයකින් ලබා ගන්නා ලද තොරතුරු බැවින් පාරිභෝගික කටයුතු පිලිබඳ අධිකාරිය පනතේ 20(8) යන උපවගන්තිය යටතේ රහස්‍ය තොරතුරු වන බව නම්, එය ඔප්පු කිරීම සඳහා යම් සාක්ෂියක් ඇත්තේද යන්න කොමිෂන් සභාව විසින් ප්‍රශ්න කරන ලදී. මෙය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි ඇති බවත්, ඒවා මෙම අවස්ථාව තුල පොදු අධිකාරිය සතුව නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.

අභියාචක මෙම අවස්ථාවේදී ප්‍රකාශ කර සිටියේ, පානිය ජල බෝතල් ආශ්‍රිතව පාලන මිලක් වසර කිහිපයකට පෙර නොතිබූ බවත්, ඔහු ඒ වෙනුවෙන් පාරිභෝගික කටයුතු පිලිබඳ අධිකාරියෙන් 2017 වර්ෂයේදී විමසීමේදී පොදු අධිකාරිය එවිට පානිය ජල බෝතල් සඳහා පාලන මිලක් නොමැති බවත්, මේ පිළිබඳව ඉදිරියේදී අවශ්‍ය පරීක්ෂණ කටයුතු සිදු කරන බවටත්, පාලන මිලක් ස්ථාපනය කරන බවටත් ප්‍රකාශ කල බවත්ය. අභියාචක විසින් තවදුරටත් තම ප්‍රකාශනයෙන් පවසන ලද්දේ පානිය ජලය යනු භූමියෙන් ලබාගත හැකි ඕනෑම පුද්ගලයෙකුට අයිති පොදු වස්තුවක් වන බැවින් එවැන්නක් සඳහා පාලන මිලක් තීරණය කිරීමේදී උපයෝගී කරගත් නිර්ණායක දැනගැනීම වැදගත් වන බවය.

පොදු අධිකාරිය විසින් ඉල්ලීම් අංක (2) යටතේ ඉල්ලීම් කර ඇති නිර්ණායක සම්බන්ධයෙන් ප්‍රකාශ කරන ලද්දේ නිර්ණායකයන් ප්‍රශ්නගත භාණ්ඩයෙන් භාණ්ඩයට වෙනස් වන බවය. තවද පාරිභෝගික කටයුතු පිලිබඳ අධිකාරියට ලැබෙන තොරතුරු (ව්‍යාපාර වර්ගය, ව්‍යාපාර ආකෘතිය ආදී තොරතුරු) අනුව ප්‍රශ්නගත කර්මාන්තයට සුදුසු මිල ව්‍යුහය නිර්ණය වන බවය. මෙහිදී සියලුම පිරිවැය සාධක (ජලය පවිත්‍ර කිරීම සඳහා පිරිවැය, හිස් බෝතලය සඳහා පිරිවැය, ලේබල් කිරීමේ පිරිවැය, කාණ්ඩය කේතීකරණය, ඇසුරුම් පිරිවැය, මුළු නිෂ්පාදන පිරිවැය, නිෂ්පාදකයාගේ ලාභාන්තිකය, ප්‍රවාහනය, තොග මිල, ජාතිය ගොඩනැගීමේ බද්ද සහ අගය එකතු කල බද්ද සහිත තොගමිල, සිල්ලර ආන්තිකය, සිල්ලර මිල ආදිය) පාලන මිල තීරණය කිරීමේදී සැලකීමට ගන්නා බවත් පොදු අධිකාරිය විසින් ප්‍රකාශ කරන ලදී. ඉන් අනතුරුව මෙලෙස පාලන මිල නිර්ණය කිරීම පිළිබඳ සංක්ෂිප්ත වගුවක් සහිත ලේඛනයක් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදී.

කොමිෂන් සභාව මෙම ලේඛනය අධ්‍යනය කොට එම නිර්ණායක වල තිබෙන්නාවූ රහස්‍යභාවය කුමක්දැයි පොදු අධිකාරියෙන් විමසන ලදී. එයට පිළිතුරු වශයෙන් පොදු අධිකාරිය පෙන්වා දෙන ලද්දේ එම සංක්ෂිප්ත ලේඛනයෙහි සඳහන් පිරිවැය සාධක නිර්ණය කිරීමට විවිධ සමාගම් විසින් රහසිගතව පොදු අධිකාරියට එවන ලද තොරතුරු යොදා ගත් අතර එම තොරතුරු වෙළඳ රහස් වන බව සහ ඒවා හෙළිදරව් කිරීම වෙළඳ තරගයට හානිකර බවත්, 2003 අංක 36 දරන බුද්ධිමය දේපල පනතේ XXXII පරිච්ඡේදයෙහි 160 වන වගන්තිය යටතේ එම තොරතුරු ආරක්ෂා කොට ඇති බවත්ය.

කොමිෂන් සභාව මෙහිදී පෙන්වා දෙන ලද්දේ තොරතුරු පනතේ 5 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව 2003 අංක 36 දරන බුද්ධිමය දේපල පනත යටතේ ආරක්ෂා කර ඇති වාණිජ රහස්, වෙළඳ රහස් හෝ බුද්ධිමය දේපළ ඇතුළු තොරතුරු හෙළිදරව් කිරීම යම් තුන්වන පාර්ශ්වයක තරඟකාරී තත්වයකට අහිතකර ලෙස බලපාන්නේ නම් පමණක් ඒවාට ප්‍රවේශ වීමේ අයිතිවාසිකම ප්‍රතික්ෂේප කල හැකි බව සහ ඉහත සඳහන් සංක්ෂිප්ත ලේඛනයට අනුකූලව කිසිදු තුන්වන පාර්ශවයක් හඳුනාගැනීමට නොමැති බව තහවුරු කරන ලදී. එබැවින් එම ලේඛනයෙහි වගුවේ ඇතුලත් කර ඇති සංඛ්‍යාත්මක දත්තයන් නොමැති නිර්ණායකයන් ලැයිස්තුව පමණක් අභියාචකට ලබාදීමට හැකි බව කොමිෂන් සභාව විසින් ස්ථාපිත කරන ලදී. එම ලැයිස්තුව කොමිෂන් සභාව ඉදිරියේ අභියාචක වෙත භාර දෙන ලදී.

කොමිෂන් සභාව විසින් ඉල්ලීම් අංක (1) සහ (3) ඔස්සේ ඉල්ලීම් කරන්නාවූ තොරතුරු ගැටලුකාරී වන බැවින්, ඒවා පිළිබඳ නිර්ණයකට එළඹීමට පෙරාතුව එම වාර්තා කොමිෂන් සභාව පරීක්ෂා කල යුතු බව පෙන්වා දක්වන ලදී.

**නියෝගය:**

ඉල්ලීම් අංක (2) යටතේ ඉල්ලීම් කර ඇති තොරතුරු සංඛ්‍යාත්මක දත්තයන් නොමැති නිර්ණායකයන් ලැයිස්තුවක් ලෙස අභියාවකට ලබාදෙන ලෙසට නියෝග කරනු ලැබේ. තවද, තොරතුරු ඉල්ලීම් අංක (1) සහ (3) සඳහන් වාර්තා පරීක්ෂාවෙන් කියවා බැලීමට කොමිෂන් සභාව අපේක්ෂා කරන අතර, එම පිටපත් මීළඟ විභාග කිරීමට කොමිෂන් සභාව වෙත ගෙන ඒමට අධිකාරියට මින් නියෝග කරනු ලැබේ.

අභියාචනය කල් තබන ලදී.

මීළඟ කැඳවීම් දිනය: 2019.12.17

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

*******